

# අප නොදුටු සැබෑ මැක් ග්‍රා




ක්‍රීඩාවෙන් සමුගන්නා විට ලොව පහල වූ සාර්ථකම වේග පන්දු යවන්නා ලෙස වාර්තා තැබූ නිසාම නොවේ. එසේත් නැත්නම් පසුගිය දශකයකට වැඩි කාලයක් ඕස්ට්‍රේලියාව ක්‍රිකට් ක්‍රීඩාවේ අංක 1 ස්ථානයේ තැබූ නිසා ද නොවේ. සැබෑ ජීවිතයේ දී ඔහු ඉතා අවංක සුන්දර පාරාර්ථකාමී පුද්ගලයකු නිසා ය.

බොහෝ ක්‍රීඩා ලෝලීන් මැක් ග්‍රා ගේ ක්‍රීඩා පිටියෙන් පිටත ජීවිතයේ ගතිගුණ හඳුණාගෙන නොතිබුණ බව නොරහසකි. එහෙත් පසුගිය දා ඔහුගෙන් සදහටම වෙන් වූ බිරිඳ ජෙනී මැක්ග්‍රා හා එක්වීම ඔහුගෙ එම ශ්‍රෙෂ්ට ගතිගුණ කියාපාන නිදසුනක් සේ සඳහන් කළ හැකි ය. ඉතාම ග්‍රාමීය

ක්‍රීඩා පීය තුළ දී ප්‍රතාවාදී ක්‍රීඩකයන් නොරුස්සන ඔහු ක්‍රීඩාලෝලීන් හඳුනන්නේ ඉතා තද ගති පැවතුම් පෙන්වන ක්‍රීඩකයකු ලෙස ය. පිටියට බට මොහොතේ සිට බාහිර ලෝකය තමා ගැන කුමක් සිතන්නේ දැයි අබමල් රේණුවකට තරම් වත් මායිම් නොකරන ඔහු තුළ ඇත්තේ එකම එක අරමුණකි. එනම් ප්‍රතාවාදී ක්‍රීඩකයන් දවා ගනිමින් තම රටට හා කණ්ඩායමට ජයග්‍රහණය ලබා දීමයි.

සිය කාර්යයට බාධාවක් වන අයුරින් පහර දෙන පිතිකරුවකු හෝ ඔහුගේ ඉල්ලීමකට හිස නොනමන විනිශ්චයකරුවකු හෝ පමණක් නොව තම කණ්ඩායමේ සගයකු ගෙන් වුව ද අතපසුවීමක් සිදුවන්නේ නම් ඔහු වියරුවෙන් මෙන් ක්‍රීඩා කරන ආකාරය ක්‍රීඩා ලෝලීන්ට හුරු පුරුදු ය. එපමණක් ද නොව පිතිකරුට තර්ජනයක් වන ආකාරයට පන්දුව පාලනය කරගත නොහැකි වන අවස්ථා වල දී ඔහු තමාටම බැන ගන්නා සැටි ද අපි දැක ඇත්තෙමු. ජයග්‍රහණය පමණක්ම අපේක්ෂා කරමින් ක්‍රීඩා කරන මේ ක්‍රීඩකයාගේ ක්‍රීඩා විලාශය බොහෝ ප්‍රතිවාදී ක්‍රීඩකයනට නොරිස්සුව ද ඔහු සැබෑ ගෞරවණීය ක්‍රීඩකයකු ලෙස සටහන් කිරීමට මම කැමැත්තෙමි. ඒ ඔහු පසුගිය වසරේ

**වසර 2004 දී ජෙනී නැවතත් බරපතල ලෙස රෝගාතුර වී මොළය ඇතුළු ශල්‍යකර්ම කීපයකටම භාජනය කළ ද දරු දෙදෙනා සමඟ සියලුම අභියෝග වලට මුහුණ දුන් මෙම ශ්‍රෙෂ්ඨ ක්‍රීඩකයා මොනම ආකාරයකින් වත් ක්‍රිකට් පිටිය තුළ අසාර්ථක නොවීම ඇදහිය නොහැකි ය. එපමණක් ද නොව මෙම සියලු කම්කටොලු මැද සුවහසක් පිළිකා රෝගීන් සුවපත් කිරීමට හා ඔවුන්ට උපකාර කිරීමේ පරමාර්ථයෙන් මැග්‍රා පිළිකා මර්දන පදනම පිහිටුවා ඒ සඳහා ඔහුගේ පෞද්ගලික මුදල් හා දානපතියන් ගේ ආධාර එක් කිරීමේ වැඩ පිළිවෙලක් ගෙන යාම අප නොදුටු මැග්‍රාත් ගේ උතුම් ක්‍රියාවකි.**

පරිසරයක ගොවිපළක හැදී වැඩුණු ග්ලෙන් ට නගරයට පිවිසීමට මාර්ගය පෑදුණේ ඔහුගේ අධිශ්ඨාන පූර්වක ක්‍රීඩා විලාශය නිසා ය. නගරයට පැමිණි මුල් අවදියේදී ජංගම නිවසක් (container house) වාසස්ථානය කරගත් ඔහු නිවස සවුත් වේල්ස් ක්‍රීඩා කණ්ඩායම් වලට ක්‍රීඩා කර පෙන් වූ දක්ෂකම් තුළින් ඔස්ට්‍රේලියානු කණ්ඩායමට ක්‍රීඩා කිරීමට අවස්ථාව උදා කර ගත්තේ ය. ඔහුගෙ පෙම්වතිය ජෙනී හමුවීම සිදුවූයේ 1995 දී ය. හොංකොං නගරයේ රාත්‍රි සමාජ ශාලාවකදී ය. එවකට ගුවන් සේවිකාවක ලෙස සේවය කළ ජෙනී ද එංගලන්තයේ ග්‍රාමීය පරිසරයක හැදී වැඩුණු කාන්තාවක් වීම ඇය හා බැඳීමට ප්‍රධානම හේතුවක් වූ බව ඔහු පවසයි. ඔහුගේ ඇරයුම පරිදි ඇය සිඩ්නි නගරයේ පදිංචියට ආවා ය.

1997 දී ඇය පිළිකා රෝගයෙන් පෙළන බව අනාවරණය වුව ද එය ජීවිතයට තවත් අභියෝග යක් මිස ප්‍රශ්නයක් කර ගැනීමට ඔහු කල්පනා නොකළේ ය. ජෙනීට අවශ්‍ය ප්‍රතාකාර ලබාදෙන අතර තුර ක්‍රිකට් ක්‍රීඩාවේ සියලුම අභියෝග ජය ගනිමින් ඉදිරියට ආ මෙම ජවසම්පන්න කඩවසම් අති දක්ෂ තරුණයාගේ හදවත දිනා ගැනීමට ලොව වටා බොහෝ ධනවත් සුරූපිනියන් උත්සාහ කළ ද ජෙනී ඔහුගේ හදවතින් වෙන් කිරීමට සමතියක් නොවී ය. 1999 දී ජෙනී ග්ලෙන් මැක්ග්‍රා විවාහය සිදුවූයේ ඔහු විසින්ම ඔහුගේ දෙමාපියන් ලවා ජෙනීගේ පවුලේ අයට යෝජනාවක් ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ය. ඔහුගේ එම ස්ථිරසාර අධිශ්ඨානය වෙනස් කළ හැකි ජගතෙක් එදා නොවී ය.

වසර 2004 දී ජෙනී නැවතත් බරපතල ලෙස රෝගාතුර වී මොළය ඇතුළු ශල්‍යකර්ම කීපයකටම භාජනය කළ ද දරු දෙදෙනා සමඟ සියලුම අභියෝග වලට මුහුණ දුන් මෙම ශ්‍රෙෂ්ඨ ක්‍රීඩකයා මොනම ආකාරයකින් වත් ක්‍රිකට් පිටිය තුළ අසාර්ථක නොවීම ඇදහිය නොහැකි ය. එපමණක් ද නොව මෙම සියලු කම්කටොලු මැද සුවහසක් පිළිකා රෝගීන් සුවපත් කිරීමට හා ඔවුන්ට උපකාර කිරීමේ පරමාර්ථයෙන් මැග්‍රා පිළිකා මර්දන පදනම පිහිටුවා ඒ සඳහා ඔහුගේ පෞද්ගලික මුදල් හා දානපතියන් ගේ ආධාර එක් කිරීමේ වැඩ පිළිවෙලක් ගෙන යාම අප නොදුටු මැග්‍රාත් ගේ උතුම් ක්‍රියාවකි.

සන්නස ක්‍රීඩා පිටුව මේ මාසයේ ඔහු වෙනුවෙන් වෙන් කළ යුතු යයි අප කල්පනා කළේ ඒ නිසාවෙනි.

මේ සටහන අවසන් කිරීමට පෙර මැග්‍රා ගේ ක්‍රීඩා දිවියේ මුල් කාලයේ දී විශේෂයෙන්ම ශ්‍රී ලංකික ක්‍රීඩා ලෝලීන් අප්‍රිය කරන සිදුවීමක් සිහිපත් කරනු කැමැත්තෙමි. එනම් 1996 බෙන්සන් ඇන්ඩ් හෙජස් අවසන් තරගයේ දී තනතිල්ල මත සනත් ජයසූරියව තල්ලු කරමින් ශාරීරික ගැටුමකට පැටලුණ අවස්ථාවයි. ඒ ගැන පසු කලෙක ඔහුගෙන් විමසූ විට ඔහුගේ පිළිතුර වූයේ ''සනත් මා ඉතා ගරු කරන ක්‍රීඩකයෙක්. එක් දින තරග සඳහා පන්දු යැවීම මා ඉගෙන ගත්තේ සනත්ගෙන් හා කලූ ගෙන්'' යන්නයි.

ඔහුගේ බිරිඳගේ වියෝගය හේතුවෙන් ඔහුත් දරු දෙනොත් මේ දිනවල ඉතා අපහසු කාල පරිච්ඡේදයක් පසුකරමින් සිටින බව නිසැක ය. ඔහු වැනි අධිෂ්ඨාන ශක්තියෙන් පිරිපුන් සිතක් ඇත්තෙකුට මේ අභියෝගයට මුහුණ දීම අපහසු නොවනු ඇති බව මගේ විශ්වාසයයි. ඔබටත් දරු දෙනොටත් මේ අසීරු අවස්ථාවන් ඉදිරියට ඒමට ශක්තිය ලැබේවායි අපි පතමු.

අසෝක සිල්වා